**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය - 2023**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 විගණන විෂයය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.2,825,607,475 ක් වූ ජර්නල් සටහන් 124 ක් යොදා තිබුණද, එයට අදාළ සනාථන සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි. | සාක්ෂි ජර්නල් සටහන් සමඟ ඉදිරිපත් කර නොමැති වුවත්, අවශ්‍ය සාක්ෂි විගණනය වෙත අවශ්‍ය පරිදි ලබාදී ඇති බවත්,ඉදිරියේදී යොදනු ලබන ජර්නල් සටහන් සඳහා අවශ්‍ය පරිදි සාක්ෂි ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බවත් දන්වා තිබුණි. | ජර්නල් සටහන්වලට අදාළ සනාථන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. |
| (ආ) | මුදල් ලබාගත් බවට අත්සනකින් තොරව කාර්යාංශයේ ශාඛා කාර්යාලවල කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් 63 ක් සඳහා 2023 වර්ෂය තුළ වැටුප් ලෙස රු.16,611,156 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන නිලධාරින් ඉතාමත් දුෂ්කර ප්‍රදේශවල පුනරුත්ථාපන රාජකාරි සඳහා යොදවා ඇති අතර, ඔවුන්ගේ වැටුප් හා දීමනා නියමිත දිනට බැංකුගත කිරීමත් ඔවුන්ගේ සේවා ස්ථාන වෙතින් ගෙන්වා ගන්නා ලද අත්සන් සහිත ලේඛන පසුව වවුචරයට ඇමිණීමට කටයුතුකර ඇති බවත්,මින් ඉදිරියට සම්පූර්ණ කරන ලද පොදු 36 පත්‍ර වැටුප් හා දීමනා ලබාගත් බවට අත්සන් ලබාගෙන වවුචරයට ඇමිණීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | මුදල් ලබාගත් බවට අත්සන්කර තහවුරු කළ යුතු ය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක | යොමුගත ගිණුම්කරණ |

| | | |
|---|---|---|
| ප්‍රමිති අංක 20 හි 17 වන ඡේදය ප්‍රකාරව රු.750,000 ක් වූ පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස දැක්විය යුතු වුව ද, දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | 20 අනුව පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් ලෙස වෙන්ව ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි. | ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 01 දිනට ගෙවිය යුතු ශේෂය ලෙස එකතුව රු.43,053,863 ක් වූ බැරකම් පවරා ගෙන තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සිගාස් වැඩසටහනට අනුව බැරකම් වටිනාකම රු.23,825,607 ක් වූයෙන් රු.19,228,256 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම විගණන නිරීක්ෂණයට අදාළ සිගාස් වැඩසටහනට ඇතුළත් කළ වගකීම් ලේඛනය විගණනය වෙත ලබාදී ඇත. | බැරකම් නිවැරදිව හඳුනාගත යුතු ය. |
| (ආ) | කන්දකාඩු හා සේනපුර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත පැමිණෙන සම්පත් දායකයින්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද විවේකාගාර ගොඩනැගිලි 02 ක් සඳහා පිළිවෙලින් 2016 දෙසැම්බර් 30 දින හා 2016 දෙසැම්බර් 31 දින එනම් අමාත්‍යාංශය යටතේ ගිණුම් තැබීමේදී ගෙවන ලද රු.3,815,021 හා රු.3,714,189 ලෙස එකතුව රු.7,529,210 ක් අත්තිකාරම් ලෙස හඳුනාගැනීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමට ගලපා තිබුණි. | කන්දකාඩු හා සේනපුර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත පැමිණෙන සම්පත් දායකයින්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද විවේකාගාර ගොඩනැගිලි 02 සඳහා ගෙවන ලද අත්තිකාරම් කෙරීගෙන යන වැඩ ගිණුමෙන් අත්තිකාරම් ගිණුමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරනු ලබන බව දන්වා තිබුණි. | ගෙවන ලද අත්තිකාරම් වෙනම ගිණුම්ගත කළ යුතු ය. |
| (ඇ) | රු.1,375,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 05 ක් පිරියත, යන්ත්‍රෝපකරණ හා වෙනත් උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට පරිගණක මෘදුකාංග යටතේ ගිණුම්ගත කර තිබුණි. | රු.1,375,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 05ක් ප්‍රමාද දෝශයක් හේතුවෙන් පරිගණක හා උපාංග යටතේ ඇතුළත් කර ඇති බවත්, නිවැරදිව යන්ත්‍රෝපකරණ හා අනිකුත් උපකරණ ගිණුමට ඇතුළත්කර අදාළ ගැලපුම් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බවත් දන්වා තිබුණි. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2023 වර්ෂයට අදාළ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙනුවෙන් කාර්යාංශයේ දායකත්වය රු. 2,878,195 ක් වූ අතර, මෙය වෙනම ගිණුමකට හර නොකොට වැටුප් හා වේතන ගිණුමට හර කර තිබුණි. | ඉදිරියේදී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙනුවෙන් කාර්යාංශයේ දායකත්වය නිසි පරිදි වෙනම ගිණුමකට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | දායක මුදල් ගිණුම්වල වෙනම පෙන්විය යුතු ය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| අධිකරණ අමාත්‍යාංශය යටතේ පැවැති මෙම කාර්යාංශය 2023 ජනවාරි 01 දින සිට ස්වාධීන ආයතනයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බැවින් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එමෙන්ම එහිදී 2023 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂයට ගලපා තිබූ ස්ථාවර වත්කම්වල අගය වෙනස් වීමේ ශුද්ධ ගැලපුම් වටිනාකම රු.61,911,543 ක් විය. මෙම වටිනාකම ගණනයේදී එකතුව රු.23,485,930ක්වූ වත්කම් කාණ්ඩ 03ක අගය වැඩි වීම හා රු.638,969,433 ක් වූ තවත් වත්කම් කාණ්ඩයක අගය අඩු වීම ගණනය කළ ආකාරය පිළිබඳව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | 662,455,363 | වත්කම් ගණනය කළ ආකාරය තහවුරු වන ලේඛන | අධිකරණ අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ උප කාර්යාල ලෙසCIGAS ගිණුම්කරණ පද්ධතියට ඇතුළත්කර තිබූ කාර්යාංශයේ වත්කම්වල අගය වූ රු. 1,534,994,759 අපහරණයක් ලෙස සලකා CIGAS ගිණුම්කරණ පද්ධතියෙන් ඉවත් කිරිම ජ'නල් සටහන් මගින් සිදුකරන ලදී.<br>මෙම විස්තරය මූල්‍ය ප්‍රකාශන තුළ මගහැරී තිබුණ ද, පැහැදිලි කිරීම් හා අදාළ සියළුම ජ'නල් සටහන් විගණනය වෙත ඉදිරිපත් කරන ලද බව දන්වා තිබුණි. | වත්කම්වල වටිනාකම තහවුරු කිරීමට අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතු ය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2015 ජුලි 23 දිනැති 07/2015 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 8 (vii) ඡේදය | එක් එක් මාසයේ දායක මුදල් ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට යැවිය යුතු වුව ද, අවස්ථා 10කදී රු. 1,729,038 ක මුදලක් නියමිත දිනට වඩා දින 02 සිට දින 32 ක් දක්වා ප්‍රමාදයක් සහිතව ප්‍රේෂණය කර තිබුණි. | ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතා මත කොන්ත්‍රාත් පදනම මත හා ස්ථිර සේවක, දායක මුදල් එකවිට අර්ථසාධක අරමුදල වෙත ලබාදීමට කටයුතු කළ අතර,මින් ඉදිරියට ප්‍රේෂණපත් ලියන පරිදි අරමුදල වෙත දායක මුදල් යැවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |
| (ආ)2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද වාර්ෂික වාර්තාවෙහි කෙටුම්පත් අධීක්ෂණයෙන් පසු 2024 මැයි 22 වන දින රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත අත් පොතෙහි පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඇ)2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය | විගණන කමිටු රැස්වීම් මාස තුනකට වරක් පැවැත්විය යුතු වුව ද, කාර්යාංශය 2023 වර්ෂය සඳහා එක් විගණන කමිටු රැස්වීමක් පමණක් 2023 දෙසැම්බර් 14 වන දින පවත්වා තිබුණි. | 2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනත 2023 පෙබරවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වූ අතර,කාර්යාංශයේ පාලක සභාවේ ප්‍රථම රැස්වීම පැවැත් වූ 2023 ජුනි මස 07 වන දින විගණන කමිටු සාමාජිකයන් පත්කරගත් බවත්,2023 වර්ෂයේ පළමු විගණන කමිටු රැස්වීම 2023 දෙසැම්බර් මස 14 දින පැවැත්වූ බවත් මින් ඉදිරියට අදාළ මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි විගණන කමිටු පවත්වන බවත් දන්වා තිබුණි.. | යොමුගත මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 66,389,263 ක ඌනතාවයක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය හා පුද්ගලික සමාගමක් එක්ව 2022 ඔක්තෝබර් 04 වන දින | අදාළ කෘෂි ව්‍යාපෘතිය සඳහා පවරා ගන්නා ලද භූමිය මුඩු භූමියක් නිසා භූමිය සකස් කර ගැනීමට ගතවූ කාල සීමාව වැඩිවීම, පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ වරින් වර ඇතිවූ කළහකාරි | අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | සිට වසර 05 ක් සඳහා අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මත පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රමය ලබා දෙමින් වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශයේ බඩ ඉරිඟු වගා ව්‍යාපෘතිය ආරම්භකර තිබුණද, එහි ඵලදාව නොලැබීම මත එම ව්‍යාපෘතිය නතර කර තිබුණි. | තත්ත්වය නිසා පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රම දායකත්වය නොලැබීම, බීජ සිටුවන අවස්ථාවේ සේනා දළඹු උවදුරට භාජනය වීම, වගාව වන සතුන්ගෙන් සහ වන අලින්ගේ නිරන්තර තර්ජනයට ලක් වීම, ස්ථිර අලි වැටක් නොමැති වීමෙන් මුදල් ගෙවා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමය ලබා ගැනීමට සිදු වීම යන හේතූන් මත අපේක්ෂිත ආදායම ලබා ගැනීමට නොහැකි වීම නිසා මෙම ව්‍යාපෘතිය නතර කර තිබුණද, මේ පිළිබඳව කාර්යාංශයේ පාලක සභාව දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | යුතු ය. |
| (ආ) | සත්ත්ව ආහාර සඳහා බඩ ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය 2022 හා 2023 වර්ෂය සඳහා පිළිවෙලින් රු.39,546,017 ක් ද, රු,10,669,110 ක් ලෙස එකතුව රු.50,215,127 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර, වර්ෂ දෙක තුළදී රු. 12,989,795 ක වියදම් දරා තිබුණි. එසේ වුවද, දෙපාර්ශවය අතර ඇති වූ අවබෝධතා ගිවිසුම විගණිත දින වන 2024 මැයි 03 දින වන විට දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 02 දින කෘෂිකර්ම අමාත්‍යාංශය හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය අතර, අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම 2023 අප්‍රේල් 30 දින අවසන් වූ අතර එය දීර්ඝ කර පවත්වා ගෙන යාමට කාර්යාංශයට අවශ්‍ය නොවූ බවත්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන මගින් මිලදී ගත් බඩ ඉරිඟු බීජ සිටුවීමෙන් ලද බඩ ඉරිඟු අස්වැන්න අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම කෘෂිකර්ම අමාත්‍යාංශය ද දැනුවත් කර රාජ්‍ය භාණ්ඩාගාරය වෙත බැර කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | කාර්යාංශයේ සේවක සුභසාධක අරමුදලක් මගින් පවත්වාගෙන යනු ලබන තෘතීයික හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (සේනපුර) විසින් බ්ලොක් ගල් හා වී වගා ව්‍යාපෘතිය පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රම දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන අතර, විගණනයට ලද තොරතුරු අනුව වී වගා ව්‍යාපෘතියේ 2023 සැප්තැම්බර් 14 දිනට වී අලෙවි ආදායම රු.1,164,500 ක් විය. එසේ වුවද පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රමදායකත්වය වෙනුවෙන් කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් ඔවුන් වෙත ලබාදීමේ වැඩපිළිවෙලක් නොවීය. | සේනපුර මධ්‍යස්ථානය යටතේ පවත්වාගෙන යනු ලබන වී වගා ව්‍යාපෘතිය කාර්යාංශ සුභසාධක අරමුදලක් මඟින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා පුනරුත්ථාපනලාභීන්ගේ ශ්‍රම දායකත්වය සහ කාර්යාංශ කාර්ය මණ්ඩලය යොදාගෙන සිදු කරන බවත්, ඉන් ලද ආදායමෙන් කොටසක් නැවත වගා කටයුතු කිරීම සඳහාත් තවත් කොටසක් සුභ සාධන කටයුතු සඳහා යොදාගන්නා බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොවන බැවින් යුද්ධ හමුදා ගිණුම් පිළිවෙතට අනුව ගිණුම් කටයුතු පවත්වාගෙන යනු ලබන බවත්, මෙම තොරතුරු ගිණුම් වල හෙළිදරව් කිරීමක් සිදු නොකළ බවත් දන්වා තිබුණි. | පුනරුත්ථාපන ලාභීන්ගේ ශ්‍රම දායකත්වයට ආර්ථික ප්‍රතිලාභීන් ලබා දීමට කටයුතු කළ යුතු ය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය වශයෙන් භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු තබන්නන් එකතු කළ අගය මත බදු වෙනුවෙන් ලියාපදිංචි වී තිබිය යුතු බවත්, එසේ නොමැති නම් ගැසට් නිවේදනය අනුව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් සහතික කර ආයතනයේ නමට ලබාගත් සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු බව ලංසු ලේඛනයේ සඳහන් වුව ද, කොලර් සහිත ටී ෂර්ට් 750 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය වෙනුවෙන් තෝරාගත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) අනුව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු විය. මෙම මිලදී ගැනීම් වෙනුවෙන් රු.858,750 ක වියදම් දරා තිබුණද, විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | තෝරාගත් ආයතනය එකතු කළ අගය මත බදු වෙනුවෙන් ලියාපදිංචි වූ සහතිකය හෝ බදු ගෙවීමට අදාළ නොවන බව සඳහන් සහතිකය හෝ ඉදිරිපත් කර නොතිබූ බවත්, සැපයුම්කරුවෙකු වෙත වැට් ගෙවීමේ දී ඔහු සක්‍රීයව බදු ගෙවන්නෙකු ද යන්න තහවුරු කර ගැනීමෙන් පසු පමණක් අදාළ ගෙවීම් සිදු කරනු ලබන බවත්,මින් ඉදිරියට තාක්ෂණික අගැයීම් කමිටුව වෙත මිළගණන් ඉදිරිපත් කිරීමට පෙර එම සහතිකය ලබාගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. . | යොමුගත ගැසට් නිවේදනය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි නේවාසිකාගාර 03 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත් වියදම සපුරාලීමට මූල්‍ය ප්‍රතිපාදන තිබෙන බවට සහතික වීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ප්‍රකාරව ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කරන බවට සහතික වීම සඳහා සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලියම සැලසුම් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.තවද, මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 60 ට වැඩි බැවින් අදියර I හා අදියර II කොන්ත්‍රාත්තු අතර මග නවතා දැමීමට කටයුතු කිරීම තුළින් මේ දක්වා දරන ලද | ඉදිකිරීම් සඳහා අවශ්‍ය මුදල් මෙම කාර්යාංශය වෙත වෙන්කර දීමට ප්‍රමාදවීම ත්, රැඳවියන් හට කොරෝනා වෛරසය ආසාදනය වීම හේතුවෙන් හා විදෙස් රටවල සිට මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකික පුරවැසියන් නිරෝධායනය කිරීම සඳහා මධ්‍යස්ථානය යොදාගැනීමත් හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇති බවත්, අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් නොඉක්මවන මිල විචලනක් ලබාදිය යුතු වුවත් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අදාළ ව්‍යාපෘති වෙනුවෙන් පිළිවෙළින් සියයට 22.41ක් හා සියයට 30.32 ක මිල විචලනයක් ලබාදීමට ක්‍රියාකර ඇති බවත් දන්වා තිබුණි. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

එකතුව රු. 35,066,985 ක මුදල නිෂ්කාර්ය වියදමක් විය. එසේම අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/21/2084/306/094 සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.2 ට පටහැනිව අදියර I හා අදියර II කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිළිවෙලින් රු.8,523,646ක් හා රු.5,382,818ක් එනම් සියයට 22 හා සියයට 30 ක මිල විචලනයකට ඉඩ දී තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 ජුනි 27 දිනැති DMS/1869 දරන ලිපියෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පුනරුත්ථාපන කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට වර්තමානයේ කාර්යාංශයේ සේවයේ නියුතු ස්ථිර සේවකයින් 13 ක් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද සේවකයින් 61 ක් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කර තිබුණු අතර, ත්‍රිවිධ හමුදාවේ නිලයන් 55 ක් හා සෙසු නිලධාරීන් 537 ක් ලෙස එකතුව 592 ක් කාර්යාංශයේ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි. | 2024 මැයි 14 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපි මඟින් ස්ථිර පත්වීම් ලබා ඇති කාර්ය මණ්ඩලය පුනරුත්ථාපන කාර්යාංශය යටතේ අන්තර්ග්‍රහණය කර ගැනීමට හා 2024 මැයි 15 දිනැති කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තු ලිපිය පරිදි කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයට ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කරන බවත්, අනුමත කාර්ය මණ්ඩලයෙන් ඉතිරි පුරප්පාඩු සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව නව බඳවා ගැනීම් සිදුකරන තෙක් හමුදා කාර්ය මණ්ඩලය මඟින් අදාළ සේවක අවශ්‍යතාවය ආවරණය කරගනු ලබන බවත් දන්වා තිබුණි. | අනුමත සේවක සංඛ්‍යාවට සිටින කාර්ය මණ්ඩල කඩිනමින් අන්තර්ග්‍රහණය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැසම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් අධ්‍යයන සංචාර හා පශ්චාත් පුනරුත්ථාපනය වූවන් සඳහා ජීවනෝපාය නැංවීම යන කාර්යයන් දෙක ක්‍රියාත්මක කර නොතිබුණි. | පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ පසුගිය කාලසීමාව තුළ සිදු වූ කණ්ඩායම් වශයෙන් පැනයාම් හා කළහකාරි තත්ත්වයන් මත ඔවුන් පිටතට රැගෙන යාමේ අවදානමක් පවතින බැවින් එම සංචාර සිදු නොකරන ලද අතර වර්ෂය තු 2024ළ අධ්‍යාපන සංචාරයක් සිදු කිරීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 4(ආ) ඡේදය ප්‍රකාරව ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින්නන් වෙනුවෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබාදීම කාර්යාංශයේ කාර්යය හා කර්තව්‍යට ඇතුළත් වුවත්, 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එය ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | අධිකරණ නියෝගවලට අනුව යොමුකරනු ලබන පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන පමනක් මේ වන විට ක්‍රියාක්මක කරනු ලබන අතර,ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය සඳහා යොමු වන පුනරුත්ථාපනලාභීන් හට නව පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතින බවත්,එම පුනරුත්ථාපනලාභීන් සඳහා වැඩසටහන් සකස් කර නිර්දේශයන් ලබාගැනීමට ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත යොමුකර ඇති බවත් දන්වා තිබුණි. | යොමුගත පනතේ කාර්යය හා කර්තව්‍ය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කළ යුතු ය. |